Page 19 April 2013.qxd 28/05/2013 16:33 Page 1



**වසර 16 ක් මේ පිටුව තුළින් ඔබේ කාන්සිය මකමින් අපි ඔබ සමග අප්‍රමාණ වාරයක් සිනාසුනෙමු. මෙහි පළවූ සමහර වදන්, කතා හා සිද්ධීන් යළි මතකයට නැගුණ විට නොදැනුවත්වම අපට සිනා යද්දී ඒ මොකදැයි මග යන්නන් අප දෙස පුදුමයෙන් බැලූ අයුරුද මතකය. අප පාඨකයින්ගේ හාස්‍යෝත්පාදනය හෙවත් ඔවුන් සිනහගැන්වීම මේ පත්‍රයේ අනෙක් විශේෂාංග මෙන්ම අපට ඉතාවැදගත් කාරණයක් වූයේය. ඒ නිසාම අපි හැමවිටම හොඳ හොඳ විහිලු ලොවපුරා හැම තැනකින්ම සොයන්නට උත්සාහගත්තෙමු. එය සාර්ථක වූ බව අපට ක්‍රමයෙන් වැටහිණ. කෙසේ නමුත් හිතවතුනි, මේ අවසාන විහිලු පිටුවයි. මින්පසු ඔබ විහිළුවකට හිනාවන හැමවිටකම අප ද ඒ සිනාව තුළ මතක තබාගන්න !**

## විශේෂ දීමනාව

**ගු**වන් ගමන් සමාගමක් සිය ගුවන් සේවය ප්‍රවලිත කරනු පිණිස ගුවනින් යන බිස්නස් පන්තියේ පිරිමි ව්‍යාපාරිකයින් සඳහා විශේෂ ගුවන් සේවා දීමනාවක් හඳුන්වාදෙන ලදී. දැන් වීම පළකර තිබුණේ මෙසේය.

" ව්‍යාපාරික මහත්වරුනි! බිස්නස් ක්ලාස් ටිකට්පතක් මිළදී ගන්නා සෑම කෙනෙකුටම ඔබගේ බිරිඳ වෙනුවෙන් නොමිලේ ගුවන් ප්‍රවේශ පත්‍රයක් දෙන්නෙමු....."

වැඩේ ඉතා සාර්ථක විය. ගුවන් සමාගම එම බිරියන්ට ස්තුතිකරමින් ඔවුන්ගෙන් " කොහොමද ට්‍රිප් එක" කියා අසා යැවීය. ඊට සියලුම බිරිය-න් පිළිතුරු වශයෙන් ගුවන් සමා ගමෙන් මෙසේ අසා යවා තිබුණි.

" මොන ට්‍රිප් එකද ? "

## ඉන්න තැන!

**බිරිඳ :** (මොබයිල් පෝනයෙන් සිය සැමියාට තරහෙන් කෑගසා) කොහේද ඕයි තමුසෙ ඉන්නෙ? දැන් වෙලාව හවස පහටත් ළඟයි ...දවල් දොළහට ගිය ගමන් ඔය...

**සැමියා :** ඩාලිං ඔයාට මතකද ටවුමෙ අර ජෝන්ස් ජුවලරි සාප් පුව.... දවසක් ඔයයි මමයි ගිය වෙලාවෙ ලස්සන මාලයක් පෙන් නලා... ඔයා ඒකට ආසයි කිව් වම... මගේ ළඟ ඒ වෙලාවෙ සල්ලි නැති නිසා මම කිව්වෙ... ඩාලිං ළඟදිම මම ඒක ඔයාට අරගෙන දෙන්නම් කියලා.... මතකද?

**බිරිඳ :** ඔව් ! රත්තරන්... මට ඒක හොඳට මතකයි...

**සැමියා :** ආන්න... හරියටම ඒ ජුවලිරි ෂොප් එක ඉස්සරහම තියන බාර් එකේ තමයි මම මේ දැන් ඉන්නෙ....ඩාලිං

## දරුවන්ට උගන්වන හැටි!

**ඒ**ක් සමාගමක විධායක නිලධාරියෙක් නගරයට ගොස් තම වාහනය නවතා කාර්යා- ලයට යන ටික දුර පයින් ඇවිදගෙන යයි. ඒ යන මග පදික වේදිකාවේ හිඟමන් යදින යාචකයෙක් වාඩිවී සිටියි. නිලධාරියා එම හිඟන්නාට රුපියල් 10 ක් දුන්නේය. ඉන්පසු හැමදාම දිගටම ඔහු ඒ රු 10 දීම නොනවතා කරගෙන ගියේය.

එහෙත් අවුරුද්දකට පසු මෙම දීමනාව රුපියල් 7.50 කට අඩුවිය. එම වෙනස හිඟන්නාට තේරුණි. " කමක් නෑ.... මුකුත්ම නොලැබෙනවට වඩා 7.50ක් ලැබෙන එක කොච්චර දෙයක්ද....?" හිඟන්නා තමාටම කියා ගත්තේ ය.

අවුරුද්දකට පසු යළිත් හදිසියේම ඒ 7.50 දීමනාව රුපියල් 5.00 ට අඩු විය. හිඟන්නාට එය වහා වැටහුණි. ඔහු ඒ වෙනස ගැන නිලධාරියාගෙන් ප්‍රශ්න කළේ ය.

" මහත්තෙයා ඉස්සෙල්ලා දිගටම මට රු 10 ක් දුන්නා.... පස්සේ ඒක 7.50 ට බැස්සුවා.... දැන් ඒක 5 ට අඩු කරලා... මොකද ඒ....? "

" ලොකු උන්නැහේ මේකයි කාරණේ...." නිලධාරියා පැහැදිලි කළේය. " කාලය අන්තිම අමාරු වේගනයි එන්නේ.... ගිය අවුරුද්දෙ මගේ ලොකු පුතා යුනිවර්සිටි එකට ඇතුල් වුණා.... හරි වියදම්... මේ අවුරුද්දෙ දුව මෙඩිකල් කොලේජ් එකට ඇතුළ් කළා...."

" මහත්තෙයට තව ළමයි කී දෙනෙක් ඉන්නවද....? "

" තව හතර දෙනෙක් ඉන්නවා...." නිලධාරියා පිළිතුරු දුන්නේය.

" මට තේරෙනවා මෙතන මොකක්ද වෙන්නෙ කියලා.... මහත්තෙයා එහෙනම් ප්ලෑන් කරන්නෙ මගේ සල්ලි වලින් දරුවන්ට උගන්වන්න.... එහෙමද...? හරි... හරි... කමක් නෑ... කමක් නෑ..." සුසුමක් හෙලූ හිඟන්නා අහක බලාගන කීවේ ය.

## ආපහු එකක් දෙන්න බැරිද?

**ඒ**ය අළුත්ම සිංහළ චිත්‍රපටියේ ප්‍රථම, හෙවත් මංගල දර්ශනයයි. ශාලාව ප්‍රේක්ෂකයන්ගෙන් පිරී පැවතුණි. එම චිත්‍රපටියේ එක් ජවනිකාවක් වූයේ සැමියෙක් ගෙදර තම බිරිඳ හා බහින්බස් වන ආකාරයයි. කේන්තියෙන් කෑගසමින් සැමියා බිරිඳට පහරක් ගැසුවේය. බිරිඳ පසෙකට වී අඩන්නට පටන්ගත්තාය. ප්‍රේක්ෂකයෝ නිශ්ශබ්දව තිරය දෙස බලා උන්හ. මුළු ශාලාවම නිහඬය. එවිටම චිත්‍රපටය නරඹමින් සිටි කුඩා දැරියක් මහ හඬින් සිය මවගෙන් මෙසේ ඇසුවා ය.

" ඇයි අම්මෙ අර ඇන්ටි අම්ම වගේ ආපහු හැරිලා ගහන්නෙ නැත්තෙ....? "

## දිවීමේ තරඟය

**ර**න් ආලේප කළ ක්‍රීඩා කුසලානක්ද අතැතිව ගෙදර දුවගෙන ආ පියදාස, කඩිමුඩියේ ගෙට රිංගා, දොර වසා එහි අගුලද දමා, ඇඳේ වාඩිවී, හති අරින්නට වූයේය. ඒ සද්දයට සාලයට ආ ඔහුගේ බිරිඳ සෝමාවතී පුදුමයෙන් මෙසේ ඇසුවාය..

***සෝමාවතී :*** හරි ගෝක් අනේ... කොහෙන්ද ඔයාට මේ ගෝල්ඩ්කප් එක හම්බ වුණේ...?

***පියදාස :*** මම රේස් එකකින් පළවෙනියට ආවා...

***සෝමාවතී :*** හානේ.... ඇත්තට...! ඔයා හරි දකෂයි නේ... ඉතින් කවුද දෙවැනි තුන්වෙනි තැන් වලට ආවේ....?

***පියදාස :*** පොලිස්කාරයා දෙවෙනියා.... කප් එක එක අයිතිකාරයා තුන්වෙනියා....!

## මගේ ලෙඩා

**ඒ**ක් වෛද්‍යවරයෙකුගේ නිවස පිහිටියේ ඔහු සේවය කරන රෝහල අසළමය. දිනක් ඔහු දහවල් කෑමට ගෙදර ආවේ ය. එවෙලේ ගෙදර ටෙලිපෝනය නාදවූයෙන් වෛද්‍ය වරයා රිසීවරය ගෙන කන තබාගත්තේ ය.

" මේ ඔයා දැන්ම එනවද....? නැද්ද....? ආවෙ නැත්තං මම මැරෙනවා....මැරෙනවා මයි...." පිරිමි කටහඬක් අනෙක් කෙළවරෙන් ඇසුණි.

" ආවෙ නැත්තං මැරෙනවා....? තමුසෙ කවුද.....? මොකක්ද තියන අමාරුව.....? "

දොස්තර මහතා ප්‍රශ්න කළේ ඒ තැනැත්තා කියූ කිසිවක් ඔහුට තේරුම්ගත නොහැකි වූ බැවිනි. මේ වෙලාවේ මෙතනට වෛද්‍යවරයා ගේ තරුණ දියණිය පැමිණ මෙසේ කීවාය.

" කෝ දෙන්න තාත්තෙ ඔය ටෙලිපෝන් එක මට.... ඔය මට අනුවෙලා ඉන්න ලෙඩෙක්....! "


# සිංහළ අවුරුදු උළෙල

**නැගණිහිර ලන්ඩනයේ නිවිහැමිහි**
**21 වන වරටත් උත්කර්ෂවත් අන්දමින්**
**2013 අප්‍රියෙල් 28 වන ඉරිදා**
**දහවල් 12 සිට පැවැත්වේ.**

**Plashet School**
**Plashet Grove, East Ham**
**London E6 1DG**
*2 minutes from East Ham underground.*
*Buses - 101, 104, 325, 238.*

**ළමා සහ වැඩිහිටි ජන ක්‍රීඩා**
**අවුරුදු කුමාරි තරඟය**
**නැටුම් ගැයුම් පිරි සංස්කෘතික සන්ධ්‍යාව**
**ඇතුල්වීම සහ ප්‍රනීත සංග්‍රහයක් නොමිලේ !**
**ඔබ සැමට ආරාධනා**
***සංවිධානය - නැගණිහිර ලන්ඩනයේ***
***සිංහළ සුබ සාධක සංගමය***

**For more information please contact:**
**Ajith - 07957313287 Ajantha - 0208 220 0781**
**Malani - 07946213995 Sumithra - 0207 474 4595**
**Shani -07956551207 Kumara - 07505997606**
**Rasika - 07706178135**

## The Rat Family මී පවුල

For most people, having rats in their home means an urgent call to pest control, but not this couple. " They make fantastic pets," said Mrs Rattray, 31. " They are very intelligent and interactive. They are up at the bars to greet us when we come in from work and we let them out to play. " They definitely have personalities and they're great fun to spend time with."

The GP had two rats while she was at university but her husband, who grew up on a farm, thought of them as vermin. That was until the couple took their first into their home in 2006 and his opinion changed. Even their more squeamish visitors have been won over and have ended up playing with the rodents. Mr Rattray, a lab supervisor, and his wife are members of the Yorkshire Rat Club, which holds regular shows. The couple last month featured in a Channel 4 documentary titled: " Head Over Heels In Rats"

**බො** හෝ දෙනාට මීයෙකු අල්ලනවා නොව උන් දැකීම පවා අප්‍රියජනක දෙයකි. එහෙත් එංගලන්තයෝ යෝක්ෂයර් හි වසන ඉහතකී යුවල සුරතලට ඇතිකරන මීයන් දොළොස් දෙනෙක් ඒ ගෙදර සිටිති. ඒ දෙදෙනගේ සැබෑ නමද හරියටම ගැලැපේ. එනම් මිස්ට සහ මිසිස් රැට්රේය. වෛද්‍යවරියක වන රැට්රේ මහත්මිය පවසන්නේ රැකියාවෙන් පසු තමා ගෙදර එන්නේ ඒ මී සුරතලුන් හා විනෝදවන බලාපොරොත්තු වෙන් බවයි. මුලදී මීයන් ගැන බයෙන් ඒ ගෙදරට ආ හිතමිතුරන් පවා දැන් උන් ප්‍රියකරන්නට පටන්ගෙන ඇත. රැට්රේ යුවල යෝක්ෂයර් ප්‍රාන්තයේ මීයන් ඇතිකරන්නන්ගේ සංගමයේ සාමාජිකයෝ ද වෙති.චැනල් 4 රූපවාහිනියේද ගියමස ඔවුන් පෙනීසිටියහ.


# ලිහිණිය LIHINIYA

**ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල**
***ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ***
**වසර 16 ක අඛණ්ඩ සේවය**

**ලංකාවිත්ති සිංහල පුවත්පතේ**
**16 වෙනි සංවත්සරයට**
**අපේ උණුසුම් සුබ පැතුම් සමග**
**ලංකාවිත්තියෙන් මෙතුවක් අප රටට,**
**දැයට හා සිංහල බසට සිදුවූ**
**අගනා අමිල සේවය වෙනුවෙන්**
**අපේ හෘදයාංගම කෘතඥතාව පළකරමු!**

**Tel. 0208 4509052**
**66 Cricklewood Broadway, London NW2 3EP**



**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට**
**වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**

# සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ **ට්‍රයිකෝ - කොළඹ**
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
**දුරකතනය 448270 / 432236**

♦ **ට්‍රයිකෝ - ගාල්ල** ♦ **ට්‍රයිකෝ - කුරුණෑගල**

**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්**
**ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.**
**දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**

# TRICO
## Shipping & Forwarding Ltd

**555 White Hart Lane**
**London N17 7RP**
**Telephone 0208 888 8787**
**Fax 0208 889 5445**
**E-Mail : trico@tricoshipping.com**
***නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය***



# SHANTHI & CO
**Solicitors & Commissioners for Oaths**

**We are an established law firm in North London**
Specialising in Immigration matters ( Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
♦ Residential / Commercial Conveyancing
♦ Landlord and Tenant Disputes ♦ Divorce♦ Employment Law
♦ General Litigation ( Sale of Goods, Services, Debts etc.)
♦ We offer comprehensive services on legal maters in Sri Lanka
***Contact*:- Shanthi Senadheera (*Solicitor*) Padmini Senadheera (*Solicitor*) Dinu Senadheera (*Solicitor*)**
**206 Seven Sisters Road, Finsbury Park, London N43NX**
**Tel. 020 7561 9494 Fax 020 7561 9495**
**Emergency: 07956 129 642 shanthi.co@btconnect.com**